සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

Department of Education, Sabaragamuwa Province/ Weekly School

විෂය - චිත්‍ර කලාව

මාර්තු 04 සතිය

ශ්‍රේණිය - 10 (I වාරය)

සැකසුම - කේ.කේ.කේ.පොල්වත්ත (නක්කාවිට ක.වි)
දැරණියගල කොට්ඨාසය

**පාඩම/ඒකකය - 7.1.3. ඇම්බැක්කේ දේවාලය**

1. ඉගෙනුම් අත්වැල

- ගම්පොළ යුගයේ ඉදිවූ ඇම්බැක්ක දේවාලය මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර මැද පළාත කෝරළයේ පිහිටා ඇත. 14 වන ශත වර්ෂයේ රජ කළ තුන් වන වික්‍රමබාහු රජ දවස දෙල්මඩ මූලාචාරී සහ ඔහුගේ ගෝලයින් විසින් මෙම දේවාලයේ නිර්මාණ කටයුතු කර ඇත.
- ඇම්බැක්ක දේවාලයේ සුවිශේෂ වූ පියස්ස, පරාල 26ක් එක් ලී ඇණයකට සම්බන්ධ කර නිර්මාණය කර ඇති ගෘහ නිර්මාණාත්මක අංගය මඩොල් කුරුපාව නමින් හඳුන්වයි.
- ඇම්බැක්ක දේවාලයේ වාස්තු විද්‍යාත්මක සැලැස්ම වාහල්කඩ මණ්ඩපය, දිග්ගෙය, ගර්භගෘහය යන අංගවලින් සමන්විත වේ. වාහල්කඩ මණ්ඩපයෙහි හා දිග්ගෙයි ඇති ලී කණු මත කැටයම් නිර්මාණ දැක ගත හැකි ය.
    - ✓ **වාහල්කඩ මණ්ඩපය** - මෙහි ලී කණු 10 කි. සෑම කණුවක ම සිව්රැස් පනේල සතර බැගින් දක්නට ඇත. ඒ අනුව පනේල කැටයම් 40කි.
    - ✓ **දිග්ගෙය** - ලී කණු 32 කි. සෑම කණුවකම සිව්රැස් පනේල සතර බැගින් ඇත. මෙහි කැටයම් 128කි.
    - ✓ **ප්‍රධාන තේමා 5ක් යටතේ කර ඇති කැටයම් නිර්මාණ** - කල්පිත සත්ත්ව මෝස්තර, සත්ත්ව මෝස්තර, ජන ජීවිතය හා සම්බන්ධ කැටයම්, වාටි මෝස්තර (ලීස්තර) මල්කම් හා ලියකම්





2. ඇගයීම

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01) ඇම්බැක්ක දේවාලයේ ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.

- යුගය/ කාලය
- අනුග්‍රහය
- ශිල්පියා

02) ඇම්බැක්ක දේවාලයේ දැකිය හැකි කල්පිත හා සමකාලීන සමාජය නිරූපණය කරන සුවිශේෂී කැටයම් නම් කරන්න.

03) වාස්තු විද්‍යා නිර්මාණවල කලාත්මක ශෛලිය සඳහා පදනම් වූ පහත අංග විස්තර කරන්න.

- සම්ප්‍රදාය
- වාස්තු විද්‍යාත්මක ප්‍රවේශ/සැලසුම්/ ආකෘති
- මාධ්‍ය හා ශිල්ප ක්‍රම

04) ඇම්බැක්ක දේවාලයේ ලී කැටයම් පිළිබඳ පහත කරුණු සැලකිල්ලට ගනිමින් කලාත්මක ඇගයීමක් කරන්න.

- මාධ්‍ය
- ශිල්ප ක්‍රමය
- ශෛලිය
- භාව ප්‍රකාශනය
- සමකාලීන සමාජ නිරූපණය